# රෝසිගේ මාල ගිරා පැටියා



නෙත්මි අංජුලා උඩුකුඹුර

# රෝසිගේ මාලගිරා පැටියා

නෙත්මි අංජුලා උඩුකුඹුර

# රෝසිගේ මාලගිරා පැටියා

කර්තෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2025 පෙබරවාරි 08

කතාව සහ චිත්‍ර

නෙත්මි අංජුලා උඩුකුඹුර

2 ශ්‍රේණිය **B**

මහ / මහාමායා බාලිකා විදුහල

**978-624-208-367-4**

# පිදුම

මාගේ ආදරණීය
අම්මාටත්, අප්පච්චිටත්
පාසලේ ආදරණීය
විදුහල්පතිනිය ඇතුළු
ගුරු මෑණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්
මාගේම දයාබර සොයුරියන්ටත්
මෙම කතා පොත ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටම සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමන්විතවීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමියන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන් අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

රෝසි කියලා ළමයෙක් හිටියා. එයාට ලස්සන මාල ගිරා පැටියෙක් ඉන්නවා. එයා රෝසි යන හැමතැනම යනවා.



රෝසි පාසලට ගියාම මාල ගිරා පැටියත් ඒ ළඟ තියෙන අඹ ගහේ අත්තක් උඩ රෝසි එනකන් බලාගෙන ඉන්නවා.



මාල ගිරා පැටියාට රෝසිගේ යාළුවොත් හරිම ආදරෙයි. එයාට හොඳට කතා කරන්නත් පුළුවන්.



දවසක් රෝසි පාසලෙන් එළියට ආව ගමන් මාල ගිරා පැටියත් රෝසි ළඟට ආවා.

"මොකද ඔයාට බඩගිනිද?"



"අද මම ඔයාට අඹ කඩලා දෙන්නම්." රෝසි කිව්වා.



රෝසි අඹ ගහට නැගලා මාල ගිරා පැටියට කන්න දෙන්න අඹ කඩන්න පටන් ගත්තා.



එක පාරටම රෝසිගේ සපත්තු දෙක ලිස්සුවා. රෝසි ගහෙන් බිමට වැටුණා. රෝසිට හොඳටම තුවාල වෙලා.



මාල ගිරා පැටියා රෝසි වැටෙණුවා දැක්කා. මාල ගිරා පැටියා හොඳටම බය වුණා.



මාල ගිරා පැටියා රෝසිගේ ගෙදර ඉක්මනින් ගියා. රෝසිගේ අම්මාට රෝසි වැටුණා කියලා කිව්වා.



අම්මා ඇවිත් රෝසිව බේරගත්තා. රෝසි මාල ගිරා පැටියාට පලතුරු ගොඩාක් දුන්නා. එදායින් පස්සේ ගෙදර අය මාල ගිරා පැටියාට ආදරේ කළා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යමය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක



දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනි තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර් යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්